ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2449/74 - 2025 අගෝස්තු මස 16 වැනි සෙනසුරාදා - 2025.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/KGK/4/9/2017/1/LA.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/11/2016/UD/521.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:-*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටුකැලේ (255) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බහිරවකන්ද, කොට්ඨාස අංක 18 - කටුකැලේ (මහනුවර මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද 2025.05.29 දිනැති මූලික පිඹුරු අංක 6891 හි කැබලි අංක 3හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0023 ක් වූ පහත සඳහන් ඉඩම් කැබැල්ල.

01. කැබලි අංක 03
ඉඩමේ නම: වරිපනම් අංක 274/4; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: සී. කේ. ජේ. එස්. කරුණාරත්න හා තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0023.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 සැප්තැම්බර් මස 29 වැනි දින පෙ. ව. 10.00 ට මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 සැප්තැම්බර් මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**එච්. එම්. එම්. යූ. බී. හේරත්,**
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ.

2025 ජූලි මස 30 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0185

1A - G 045154 - 14 (2025/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*